# 8 ශ්‍රේණිය සිංහල

## 13 ඒකකය

# වාක්‍ය රීති



සැකසුම - හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

පසුගිය සතියේ online පංතිය සඳහා සහභාගී වීමට නොහැකි වුනු සිසුන් සඳහා සහභාගී වූ සිසුන්ගේ උපකරයෙන් ලබා දුන් උපකාරක සටහනකි.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

Kajini

# වාක්‍ය රීති 01

## හැඳින්වීම

ශාස්ත්‍රීය ලේඛනය ද නිර්මාණාත්මක ලේඛන ද හොඳ නැගෙන්නේ වාක්‍ය ව්‍යාකරණානුකූල වීමෙනි. නිවැරදි වාක්‍ය නිවැරදි ලේඛනයට රැකුලකි. ඒ සඳහා වාක්‍යය රීති මැනවින් ප්‍රගුණ කළ යුතුය.

## (1) ලිංග භේදය

* පුරුෂ ලිංග නාම පද - පිරිමි අර්ථයක් පළ කරන පද

  උදා:- ළමයා, විදුහල්පතිතුමා

* ස්ත්‍රී ලිංග නාම පද - ස්ත්‍රී අර්ථයක් පළ කරන පද

  උදා:- ගුරුතුමී, ශිෂ්‍යාවෝ.

* නපුංසක ලිංග නාම පද - අප්‍රාණවාචී අචේතනික නාම පද

  උදා:- සීනුව, ශීතය

## ලිඛිත අභ්‍යාස

1. පහත සඳහන් නාම පද සුදුසු පරිදි යොදා දී ඇති වගුව සම්පූර්ණ කරන්න.

ඇතා, පොත්, ස්ත්‍රිය, කුරුල්ලන්, පෙට්ටිය, මැණියෝ, ඇස, බල්බය, වලසුන්, ලේඛකයා, දුම්රිය, කපුටෝ, සෙබළුන්, සිසුවිය, වැව්, කිඹුල්ලු, දූවරුන්, තාප්පය, මගියා, නිලධාරිනිය, සේවිකාව, ගම, කවීකයා, කම්කරුවන්, ඇතින්න, සිරුර, නැන්දා, අක්කලා, මුද්දර

| පුරුෂ ලිංග නාම පද | ස්ත්‍රී ලිංග නාම පද | නපුංසක ලිංග නාම පද |
|---|---|---|
| | | |

(i) පුරුෂ ලිංග නාම පද

ඇතා ✓ සෙබළුන් ✓
කුරුල්ලන් ✓ කිඹුල්ලු ✓
වලසුන් ✓ මගියා ✓
ලේඛකයා ✓ කවීකයා ✓
කපුටෝ ✓ කම්කරුවන් ✓

(ii) ස්ත්‍රී ලිංග නාම පද

ස්ත්‍රිය ✓ සේවිකාව ✓
මැණියෝ ✓ නැන්දා ✓
සිසුවිය ✓ අක්කලා ✓
දූවරුන් ✓ ඇතින්න ✓
නිලධාරිනිය ✓

(iii) නපුංසක ලිංග නාම ප

| | |
|---|---|
| පොත් | වැව් |
| පෙට්ටිය | තාප්පය |
| ඇස් | ගම |
| බල්බය | සිරුර |
| දුම්රිය | මුද්ද |

(ii) වචන භේදය

* ඒක වචන පද - එක් දෙයක් හෝ කෙනෙ
ක් පිළිබඳ කියාවෙන පද

උදා:- සීනුව ළමයා

* බහු වචන නාම පද - එක් දෙයකට හෝ
වැඩි දෙනෙක් හෝ
කෙනෙක් පිළිබඳ
කියාවෙන පද

උදා:- සීනු, ළමයි.

## ලිඛිත අභ්‍යාස

1. හිස් තැන්වලට සුදුසු ඒක වචන පද හෝ බහු වචන පද හෝ යොදා පහත සඳහන් වගුව සම්පූර්ණ කරන්න.

| | ඒක වචන | බහු වචන | | ඒක වචන | බහු වචන |
|---|---|---|---|---|---|
| 1 | මිනිසා | මිනිස්සු | 11 | ........................ | කුඹුරු |
| 2 | ශිෂ්‍යයා | ........................ | 12 | ගස | ........................ |
| 3 | ........................ | උගතෝ | 13 | ........................ | ශබ්ද |
| 4 | කම්කරුවා | ........................ | 14 | ගෙය | ........................ |
| 5 | ........................ | ගුරුවරු | 15 | කථාව | ........................ |
| 6 | ........................ | තරඟකරුවෝ | 16 | ........................ | මෝස්තර |
| 7 | ව්‍යාඝ්‍රයා | ........................ | 17 | හැන්ද | ........................ |
| 8 | ........................ | සිසුවියෝ | 18 | ........................ | සාප්පු |
| 9 | ඉබ්බා | ........................ | 19 | කෝච්චිය | ........................ |
| 10 | ........................ | පරිසරවේදීහු | 20 | මුද්ද | ........................ |

① 2. ශිෂ්‍යාවන් ශිෂ්‍යයෝ
3. උගතා
4. කම්කරුවෝ
5. ගුරුවරයා
6. තරඹන්නා
7. ව්‍යාඝ්‍රයෝ
8. සිසුවියා
9. ඉබ්බන් ඉබ්බෝ
10. පරිසරවේදියා
11. කුඹුර
12. ගස්
14 ගෙවල්
15 කථා
16 මෝස්තරය
17 හැඳි
18 සාප්පුව
19 කෝච්චි
20 මුදු
13 ශබ්දය

| | වර්තමාන කාලය | අතීත කාලය |
|---|---|---|
| උත්තම පුරුෂය | මම අඹ කමි.<br>අපි අඹ කමු. | කෑවෙමි.<br>කෑවෙමු. |
| මධ්‍යම පුරුෂය | තුඹ අඹ කහි<br>තුඹලා අඹ කහු | කෑවෙහි<br>කෑවෙහු |
| ප්‍රථම පුරුෂය | කුරුල්ලා අඹ කයි<br>කිරිල්ලී අඹ කයි<br>කුරුල්ලෝ අඹ කති<br>කිරිල්ලියෝ අඹ කති | කෑවේය<br>කෑවාය<br>කෑවෝය / කෑව<br>කෑවෝය / කෑව |

## ලිඛිත අභ්‍යාස

1. කොටුවෙහි සඳහන් වචන ගැළපෙන අදහසක් ඇති වන පරිදි හිස් තැන්වලට යොදා නිවැරදි වාක්‍ය ගොඩ නගන්න.

> රියැදුරෝ, අශ්වයා, නංගී,
> සරුංගලය, ගුවන් යානය,
> උකුස්සෝ,ගොවියෝ, වරදකරුවන්,
> නාහිමියෝ, අපි

i. ................................ කවියක් කීවා ය.
ii. ................................ අහසෙහි ලෙළ දෙයි.
iii. ................................ කුඹුර වපුරති.
iv. ................................ ගුවන් තොටුපළට ළඟා විය.
v. ................................ වේගයෙන් දුවන්නේ ය.
vi. ................................ පොත් පාඩම් කරමු.
vii. ................................ දහම් දෙසති.
viii. ................................ වාහන නතර කළහ.
ix. ................................ ඉහළ අහසෙහි පියාඹති.
x. ................................ පොලීසියට හසු වූහ.

(1)
i. නංගි
ii. සරුංගලය
iii. ගොවියෝ
iv. ගුවන් යානය
v. අශ්වයා
vi. අපි
vii. හාහිමියෝ
viii. රියදුරෝ
ix. උකුස්සෝ
x. වරදකරුවෝ

2. පහත දැක්වෙන ක්‍රියා පද යොදා වාක්‍යය බැගින් තනන්න.

බලති, කියවයි, වෙත්වා, කීවා ය, කළේ ය, දල්වයි, නැරඹීම්, නැටුවෝ ය, වැටෙයි, වඩිති.






පැරණි ව්‍යාකරණය අනුව නපුංසක ලිංග ලෙස හැඳින්වුණේ අප්‍රාණවාචි හෙවත් අචේතන ගණයේ නාම පද යි. සිංහල භාෂාවේ ලිංග භේදයක් දැකිය හැක්කේ ප්‍රාණවාචි නාමයන්හි ය. එනම් ස්ත්‍රී ලිංග, පුරුෂ ලිංග වශයෙනි. වර්තමානයේ ප්‍රාණවාචි පද පමණක් ඒ යටතේ වර්ගීකරණය කෙරෙන අතර අප්‍රාණවාචි පද ලිංග භේදය යටතේ වර්ගීකරණය නො කෙරෙයි. ප්‍රාණවාචි හෙවත් සචේතන සහ අප්‍රාණවාචි හෙවත් අචේතන යන වර්ගීකරණයට අනුව අචේතන ගණයට ඇතුළත් කෙරෙනුයේ පැරණි ව්‍යාකරණයේ නපුංසක ලිංග ලෙස හැඳින්වුණු නාම යි.

- නාම පද
  - සචේතන
    - ස්ත්‍රී ලිංග
    - පුරුෂ ලිංග
  - අචේතන

# වාක්‍ය නිර්මාණය

වාක්‍යයක් යනු කුමක්ද?

**වාක්‍යයක් යනු සම්පූර්ණ අදහසක් ප්‍රකාශ කරන වචන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක එකතුවකි.**

උදා :-

මම කමි → මෙහි වචන දෙකකි. එහෙත් සම්පූර්ණ අර්ථයක් ප්‍රකාශ වේ.

මම බත් කමි → මෙහි වචන තුනකි. පෙර වාක්‍යයට වඩා අර්ථය පැහැදිලි වී ඇත.

**මේ ආදී වශයෙන් යම් අදහසක් ප්‍රකාශ කිරීමට අප වාක්‍ය නිර්මාණය කරනු ලබයි.**

සරල වාක්‍යයක ප්‍රධාන කොටස් තුනකි.

එනම් → කර්තෘ

→ කර්ම

→ ක්‍රියා යනුවෙනි.

**අප ගොඩ නගන ඕනෑම වාක්‍යයක් ව්‍යාකරණයට අදාළව ගොඩ නැගිය යුතු ය.**

එහිදී **කර්තෘ**

**කර්ම**

**ක්‍රියා** යන වාක්‍යයේ ප්‍රධාන කොටස් තුන හොඳින් අවබෝධ කර ගත යුතුය.

**<u>කර්තෘ</u>**

කර්තෘ යනුවෙන් අදහස් කරනු ලබන්නේ යම් වාක්‍යයක ක්‍රියාව සිදු කරනු ලබන පදයයි.

**කර්තා යනු කරන්නා යන අදහසයි.**

***අනුව ක්‍රියාව සිදු කරන්නා*** කර්තෘ නම් වේ.

**උදා :- ගුරුවරයා පාඩම උගන්වයි.**

ඉහත වාක්‍යයේ උගන්වයි යනු ක්‍රියාවයි. එම ක්‍රියාව සිදු කරනු ලබන්නේ ගුරුවරයාය. ඒ අනුව ගුරුවරයා යනු <u>කර්තෘ</u> පදයයි.

***<u>කර්තෘ පහසුවෙන් සොයන්න ක්‍රමයක්</u>***

ඔබට කර්තෘ පදය පහසුවෙන් සොයා ගැනීමට අවශ්‍ය නම් වාක්‍යයේ ක්‍රියා පදයෙන් ප්‍රශ්නයක් අසන්න.

ළමයා පාසල් යයි. ප්‍රශ්නය යන්නේ කවුද?

**ඒ අනුව පිළිතුරු ළමයා නම් කර්තෘ පදය** වේ.

බල්ලෝ සොරුන්ට බුරයි → ප්‍රශ්නය බුරන්නේ කවුද?
එවිට පිළිතුර බුරන්නේ බල්ලෝ යන්නයි.
කර්තෘ පදය බල්ලෝ වේ.

නංගී මල් කැඩුවා ය. → ප්‍රශ්නය මල් කඩන්නේ කවුද?
පිළිතුරු නංගී යන කර්තෘ පදයයි.

සීයා බිට කයි. → ප්‍රශ්නය කන්නේ කවුද? පිළිතුරු සීයා යන කර්තෘ පදය යි.

## <u>කර්මය</u>

යම්කිසි වාක්‍යයක කර්තෘගේ ක්‍රියාවට යටත්වන හෙවත් ගොදුරු වන පදය කර්මය යි.
ගොවියා කුඹුර කොටයි.

ඉහත වාක්‍යයේ කොටයි යනු ක්‍රියාවයි. එම කෙටීමට හසු වන්නේ කුඹුරයි. ඒ අනුව කර්ම පදය කුඹුර වේ.

***<u>දැන් කර්ම පදය පහසුවෙන් සොයමු.</u>***

- අම්මා පොළට ගියා ය.

  පළමු ප්‍රශ්නය ගියේ කවු ද? පිළිතුර අම්මා නම් කර්තෘ පදයයි.
  දෙවැනි ප්‍රශ්නය ගියේ කොහෙට ද? පිළිතුර පොළට වේ. එය කර්ම පදයයි.

**ඒ අනුව ක්‍රියාවෙන් අසන දෙවනි ප්‍රශ්නයට පිළිතුර කර්මයයි.**

- ළමයි සෙල්ලම් කරති → කරන්නේ කවු ද? → ළමයි එනම් කර්තෘ පදයයි.
  කරන්නේ මොනවා ද? →සෙල්ලම් එනම් කර්මය වේ.
- කුරුල්ලෝ අහසේ පියාඹති → පියාඹන්නේ කවු ද? කුරුල්ලෝ → එනම් කර්තෘ පදයයි.
  පියාඹන්නේ කොහේද අහසේ එනම් කර්මයයි.
- ගුරුවරයා පාඩම උගන්වති → උගන්වන්නේ කවුද? ගුරුවරු → එනම් කර්තෘ පදයයි.
  උගන්වන්නේ මොනවා ද? → පාඩම් එනම් කර්මයයි.

**ක්‍රියාව**

**ක්‍රියාව යනු කර්තෘ විසින් කරනු ලබන දෙයයි.**

දැන් අපි වාක්‍ය කිහිපයක කර්තෘ කර්ම ක්‍රියාව හඳුනා ගනිමු.

ළමයි පොත් කියවති.
↓ ↓ ↓
කර්තෘ කර්ම ක්‍රියාව

දැරිය මල් කඩයි
↓ ↓ ↓
කර්තෘ කර්මය ක්‍රියාව

මාමා මුහුදු ගියේය
↓ ↓ ↓
කර්තෘ කර්ම ක්‍රියාව

මිනිස්සු වැඩ කරති
↓ ↓ ↓
කර්තෘ කර්ම ක්‍රියාව

නරි හූ කියති
↓ ↓ ↓
කර්තෘ කර්ම ක්‍රියාව

ඇතැම් වාක්‍ය කර්ම පදය සහිතව යෙදේ. ඒවා ***සකර්මක*** වාක්‍ය ලෙස හැඳින්වේ.

එහෙත් කර්ම පදය නොමැතිව කර්තෘ හා ක්‍රියාව සහිත වාක්‍යය ද ඇත. ඒවා අකර්මක හෙවත් කර්ම පදය නොමැති වාක්‍යයි.

උදා :- හිරු පායයි
↓ ↓
කර්තෘ ක්‍රියාව

සඳ බබළයි
↓ ↓
කර්තෘ ක්‍රියාව

මල් පිපෙයි
↓ ↓
කර්තෘ ක්‍රියාව

සුළං හමයි
↓ ↓
කර්තෘ ක්‍රියාව

**මෙහි දී වැදගත් ම කාරණාව වන්නේ ක්‍රියාවෙන් කියවෙන පදය උක්ත පදය ලෙස හැඳින්වීමයි.**

❖ එවිට මෙතෙක් කතා කළ සියලු වාක්‍යවල කර්තෘ පද උක්ත පද ලෙස හැඳින්විය හැක.
❖ ක්‍රියා පදය ආඛ්‍යාතය ලෙස හඳුන්වයි.

ඒ අනුව උක්ත හා අඛ්‍යාත පද නිවැරදිව ගැළපීම වාක්‍යකරණය තුළ දී සිදු වේ.

අපි එවැනි රීති කිහිපයක් සලකා බලමු.

01. *යම් වාක්‍යයක උක්ත පදය ඒක වචන නම් ක්‍රියා පදයක් ඒක වචනයෙන් තැබිය යුතු ය.*

උදා :- මම පාඩම් කරමි.

මම ↓ මෙය ඒක වචන උක්ත පදයකි.

කරමි ↓ ඒක වචන අඛ්‍යාත පදයකි.

- තාත්තා වැඩට යයි.
- ගොවියා කුඹුර කොටයි.
- බල්ලා කෑම කයි.
- නංගී පාසල් යන්නීය.
- ඇතා පොල් කොළ කෑවේය.
- සිංහයා මස් කයි.
- ගුරුවරයා පාඩම උගන්වයි.
- කුරුල්ලා නාද කරයි.

02. *එසේම යම් වාක්‍යයක උක්ත පදය බහු වචන නම් ආඛ්‍යාත පදයත් බහු වචනයෙන් ම තැබිය යුතුය.*

බල්ලෝ උඩ බුරති

බල්ලෝ ↓ බහුවචන උක්ත

බුරති ↓ බහු වචන ආඛයාතය

- කාන්තාවෝ ලිඳට යති.
- කුරුල්ලෝ නාද කරති.
- වඳුරෝ අත්තෙන් අත්තට පනිති.
- මිනිස්සු වැඩ කරති.
- පව්කාරයෝ අපායේ යන්නෝය.

03. *පුරුෂ භේදය අනුව උක්ත ආඛ්‍යාතය තබමු.*

| | | | |
|---|---|---|---|
| උත්තම පුරුෂ | මම → මි | - | මම පාසල් යමි |
| | අපි → මු | - | අපි පාසල් යමු. |

මම හවසට මල් කඩමි.

අපි හවසට මල් කඩමු.

මම දිනපතා පාඩම් කරමි.

අපි දිනපතා පාඩම් කරමු.

| | |
|---|---|
| මධ්‍යම පුරුෂ | නුඹ /තො → හි |
| | නුඹලා / තොපි → හු |

- නුඹ පාසල් යහි / තො පාසල් යහි
  නුඹලා පාසල් යහු / තොපි පාසල් යහු

- නුඹ දෙමාපියන් නමදිහි / තො දෙමාපියන් නමදිහි.
  නුඹලා දෙමාපියන් නමදිහු / තොපි දෙමාපියන් නමදිහු.

- නුඹ චාරිකාවක් යන්නෙහි / තෝ චාරිකාවක් යන්නෙහි
  නුඹලා චාරිකාවක් යන්නෙහු / තොපි චාරිකාවක් යන්නෙහු

**ප්‍රථම පුරුෂ**

- ළමයා පොත පාඩම් කරයි.
- ළමයි පොත් පාඩම් කරති.

- මිනිසා ගස කපයි.
- මිනිස්සු ගස් කපති.

04. *අප්‍රාණවාචී ඒක වචන හෝ බහු වචන පදයක් උක්තය සඳහා යෙදුණු කල්හි ආඛ්‍යාතය ඒක වචනයෙන් ම තැබිය යුතු ය.*

| | | |
|---|---|---|
| ගංගා ගලා යයි. | → | **ගංගාවෝ ගලා යයි.** |
| සුළඟ හමයි. | → | **සුළං හමයි.** |
| ගස් සුළඟට පෙරළෙයි. | → | **ගස් සුළඟට පෙරළෙයි.** |
| තරුව අහසේ බබළයි. | → | **තරු අහසේ බබළයි.** |
| කොළය සුළඟට වැටෙයි. | → | **කොළ සළඟට වැටෙයි.** |

## පහත වගුව බලන්න.

| | වර්තමාන | අනාගත | අතීත |
|---|---|---|---|
| උත්තම පුරුෂ | මම පාඩම් කරමි.<br>අපි පාඩම් කරමු. | මම පාඩම් කරන්නෙමි.<br>අපි පාඩම් කරන්නෙමු. | මම පාඩම් කෙරුවෙමි.<br>අපි පාඩම් කෙරුවෙමු. |
| | මම බත් කමි.<br>අපි බත් කමු. | මම බත් කන්නෙමි.<br>අපි බත් කන්නෙමු. | මම බත් කෑවෙමි.<br>අපි බත් කෑවෙමු. |
| මධ්‍යම පුරුෂ | නුඹ පාසල් යහි<br>නුඹලා පාසල් යහු | නුඹ පාසල් යන්නෙහි.<br>නුඹලා පාසල් යන්නෙහු. | නුඹ පාසල් ගියෙහි.<br>නුඹලා පාසල් ගියෙහු. |
| | නුඹලා විභාගය සමත් වෙහු. | නුඹලා විභාගය සමත් වන්නෙහු. | නුඹලා විභාගය සමත් වුවෙහු. |
| ප්‍රථම පුරුෂ | ආච්චි පැදුර වියයි.<br>අම්මාවරු දනට වඩියි. | ආච්චි පැදුර වියන්නීය.<br>අම්මාවරු දනට වඩින්නෝ ය. | ආච්චි පැදුර විව්වේය.<br>අම්මාවරු දනට වැඩියෝ ය. |
| | වෙළෙන්දා බඩු විකුණයි.<br>වෙළෙන්දෝ බඩු විකුණති. | වෙළෙන්දා බඩු විකුණන්නේය.<br>වෙළෙන්දෝ බඩු විකුණන්නෝ ය. | වෙළෙන්දා බඩු විකුණුවේ ය.<br>වෙළෙන්දෝ බඩු විකුණුවෝ ය. |
| | ඔහු පොත් ලියයි.<br>ඔවුහු පොත් ලියති. | ඔහු පොත් ලියන්නේය.<br>ඔවුහු පොත් ලියන්නෝය. | ඔහු පොත් ලිව්වේය.<br>ඔවුහු පොත් ලිව්වෝ ය. |

**ඉහත වගුවෙන් අතීත, වර්තමාන, අනාගත කාලවල ආඛ්‍යාතය වෙනස්වන ආකාරය ඔබට දැක ගත හැක.**

## අප්‍රාණවාචී උක්ත ආඛ්‍යාත පද කාල තුනට බෙදමු.

| වර්තමාන කාලය | අතීත කාලය | අනාගත කාලය |
|---|---|---|
| i. සුළං වේගයෙන් හමයි.<br>ii. සුළඟ වේගයෙන් හමයි. | i. සුළං වේගයෙන් හැමුවේය.<br>ii. සුළඟ වේගයෙන් හැමුවේය. | i. සුළං වේගයෙන් හමන්නේය.<br>ii. සුළඟ වේගයෙන් හමන්නේය. |
| iii. තරුව අහසේ පායයි.<br>iv. තරු අහසේ පායයි. | iii. තරුව අහසේ පෑව්වේය.<br>iv. තරු අහසේ පෑව්වේය. | iii. තරුව අහසේ පායන්නේය.<br>iv. තරු අහසේ පායන්නේ ය. |
| v. සඳ රාත්‍රියට බබළයි. | v. සඳ රාත්‍රියට බැබලුවේ ය. | v. සඳ රාත්‍රියට බබලන්නේ ය. |
| vi. ගස සුළඟට වැනෙයි.<br>vii. ගස් සුළඟට වැනෙයි. | vi. ගස සුළඟට වැනුනේ ය.<br>vii. ගස් සුළඟට වැනුනේ ය. | vi. ගස සුළඟට වැනෙන්නේය.<br>vii. ගස් සුළඟට වැනෙන්නේ ය. |
| viii. ගඟ වේගයෙන් ගලයි.<br>ix. ගංගා වේගයෙන් ගලයි. | viii. ගඟ වේගයෙන් ගැලුවේය.<br>ix. ගංගා වේගයෙන් ගැලුවේය. | viii. ගඟ වේගයෙන් ගලන්නේය.<br>ix. ගංගා වේගයෙන් ගලන්නේය. |

**මෙසේ වගුව තුළින් අප්‍රාණවාචී උක්ත පද වාක්‍යවල යෙදීමේ දී ආඛ්‍යාතය හෙවත් ක්‍රියා පදය ඒක වචනයෙන් ම සිටින බව පැහැදිලි වේ. මේ අනුව වාක්‍ය නිර්මාණය අවබෝධ කරගත හැක.**

**පාඩමේ ඔබ මතක තබාගත යුතු කොටස්**

- උක්තය ඒක වචන නම් ආඛ්‍යාතය ඒක වචන වේ.
- උක්තය බහු වචන නම් ආඛ්‍යාතය බහු වචන වේ.
- උක්තය ඒක වචන වුවත් බහු වචන වුවත් අප්‍රාණවාචී නම් අඛ්‍යාතය ඒක වචන වේ.
- උක්තයේ පුරුෂය අනුව ම ආඛ්‍යාතය තැබිය යුතුය.
- උක්තය ප්‍රථම පුරුෂ නම් ආඛ්‍යාතය ප්‍රථම පුරුෂ වේ.
- උක්තය මධ්‍යම පුරුෂ නම් ආඛ්‍යාතයත් මධ්‍යම පුරුෂ වේ.
- උක්තය උත්තම පුරුෂ නම් ආඛ්‍යාතයන් උත්තම පුරුෂ වේ.

## ප්‍රශ්න පත්‍ර 01

වාක්‍ය නිර්මාණය පාඩම ඇසුරෙන් පිළිතුර සොයන්න.

01. පහත හිස් තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

i අමර උදෑසනම පාසල් ……………………………..(ගියේ ය/ යති / ගියෙමු.)

ii මම ඉදුණු අඹ ………………………….(කහි / කමි / කෑවේ ය)

iii නුඹලා හොඳින් පාඩම් ………………………….(කරති / කරහු / කරමු.)

iv කාන්තාවෝ පොළට ……………………….(ගියෝ ය/ යහු / ගියේ ය)

v අපි ශ්‍රී පාදය වන්දනා ……………………….(කරමි / කළෙමු / කරති)

vi ළමයි පාසලේ ඉගෙන ……………………….( ගනියි / ගනිති / ගන්නේ ය)

vii අම්මා පාන්දරම ආහාර ……………………….( පිසියි / පිසුවෙමි / පිසුවා ය.)

viii වෙළෙන්දා රටකජු ……………………….(විකුණුවෝ ය/ විකුණයි / විකුණති )

ix නුඹ ගෙදර වැඩ ……………………….(කළෙහි / කළෙහු / කළෙමි )

x නුඹල ගීයක් ……………………….(ගයහි / ගයමු. / ගයහු )

---

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

02. හිස්තැනට ගැළපෙන උක්ත පදය වරහන් තුළින් තෝරා ලියන්න.

i ……………………….පාඩම් උගන්වති. (ගුරුවරයා/ ගුරුවරු/ ගුරුවරිය)

ii ……………………….බුදුන් වැන්දෙමි. (අප / මම / ඇය)

iii ……………………….පන්තියට සහභාගි වූවෙමු. ( මම / ඔවුහු / අපි )

iv ……………………….යාචකයන්ට ආහාර බෙදුවෙහි. ( නුඹලා / තෝ / අපි )

v ……………………….සෙල්ලම් කරති. (ළමයා / ළමයි / මම )

vi ……………………….ශ්‍රී මහා බෝධිය වන්දනා කළෙහු. (නුඹලා/ නුඹ / අපි)

vii ……………………….රෙදි සේදුවා ය. (ඔවුහු / ඔහු / ඇය)

viii ……………………….සීගිරිය නැරඹීමට ගියෝ ය. ( සංචාරකයා/ සංචාරකයෝ)

ix ……………………….කුඹුරු කෙටුවෝ ය. ( ගොවියා / ගොවියෝ )

x ……………………….පැළ සිටුවමි. ( මම / අපි / නුඹලා)

03. නිවැරදි පිළිතුර තෝරා යටින ඉරක් අඳින්න.

i ප්‍රථම පුරුෂ ඒක වචන අතීත කාල වාක්‍යයකි.

- i මම බුදුන් වැන්දෙමි.
- ii නුඹලා ගෙදර යහු.
- iii රුවන් චිත්‍රයක් ඇන්දේ ය.
- iv අපි සීගිරිය නරඹමු.

ii මධ්‍යම පුරුෂ බහු වචන අනාගත කාල වාක්‍යයකි.

- i නුඹලා පන්සල් යන්නෙහු.
- ii නුඹලා පන්සල් ගියෙහු.
- iii නුඹලා පන්සල් යහු.
- iv නුඹ පන්සල් යයි.

iii ප්‍රථම පුරුෂ බහු වචන ස්ත්‍රී ලිංග වාක්‍යයකි.

- i අපි පොළට ගියෙමු.
- ii කාන්තාවෝ පොළට ගියෝය.
- iii ඇය පොළට ගියා ය.
- iv නුඹ පොළට යහි.

iv උත්තම පුරුෂ බහු වචන වර්තමාන කාල වාක්‍යයකි.

- i අපි රචනාවක් ලියමු.
- ii අපි රචනාවක් ලිව්වෙමු.
- iii අපි රචනාවක් ලියන්නෙමු.
- iv මම රචනාවක් ලිව්වෙමි.

---

පිළිතුරු **3 in 1 youtube** නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

v ප්‍රථම පුරුෂ බහු වචන අතීත කාල වාක්‍යයකි.

i ගුරුවරු පාඩම් උගන්වති. ii ගුරුවරු පාඩම් උගන්වන්නෝ ය.

iii ගුරුවරු පාඩම් ඉගැන්නුවෝ ය.iv ගුරුවරයා පාඩම උගන්වයි.

vi මධ්‍යම පුරුෂ ඒක වචන අනාගතකාල වාක්‍යයකි.

i නුඹ දිය නෑමට වැවට යන්නෙහි.

ii නුඹ දිය නෑමට වැවට යහි.

iii නුඹ දිය නෑමට වැවට ගියෙහි.

iv නුඹලා දිය නෑමට වැවට යහු.

## ප්‍රශ්න පත්‍ර 02

01. පහත සඳහන් වාක්‍ය අතරින් නිවැරදි වාක්‍ය තෝරන්න.

1) i ළමයි නිවාඩු කාලයේ චාරිකාවක් ගියෙහි.

ii ළමයි නිවාඩු කාලයේ චාරිකාවක් ගියෝ ය.

iii ළමයි නවාඩු කාලයේ චාරිකාවක් ගියෙමු.

iv ළමයි නිවාඩු කාලයේ චාරිකාවක් ගියෙහු.

2) i ඔවුහු පොත් පාඩම් කළේ ය.

ii ඔවුහු පොත් පාඩම් කරයි.

iii ඔවුහු පොත් පාඩම් කරන්නේය.

iv ඔවුහු පොත් පාඩම් කරති.

3) i මම ඉහළින් ම විභාගය සමත් වෙමි.

ii මම ඉහළින් ම විභාගය සමත් වෙමු.

iii මම ඉහළින් ම විභාග සමත් වෙහු.

iv මම ඉහළින් ම විභාගය සමත් වෙහි.

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

4) i අපි ළමා චිත්‍රපලටයක් බලමු.

ii අපි ළමා චිත්‍රපටයක් බලමි.

iii අපි ළමා චිත්‍රපටයක් බලහි.

iv අපි ළමා චිත්‍ර පටයක් බලති.

5) i අම්මා උදෑසනම අවදි වූවා ය.

ii අම්මා උදෑසන ම අවදි වූහ.

iii අම්මා උදෑසනම අවදි වෙති.

iv අම්මා උදෑසනම අවදි වෙහු.

02. පහත වාක්‍යවල හිස්තැන් පුරවන්න.

i) ..............................දුන්හිඳ ඇල්ල නැරඹුවෝය.

i සංචාරකයෝ ii සංචාරකයන් iii සංචාරකයා iv සංචාරකයකු

ii) තොපි දෙමව්පියන් ........................................

i නමදින්නෙහි ii නමදිති iii නමදින්නේ ය. iv නමදිහු

iii) බොහෝ සිවුපා සත්තු වනයේ ........................................

i සැරිසැරුවේය. ii සැරිසරති. iii සැරිසරයි. iv සැරිසරන්නේ ය.

iv) සිංහ කොඩිය අහසේ ........................................

i ලෙළදෙහි ii ලෙළෙදෙති iii ලෙළදෙහු iv ලෙළදෙයි

v) කම්හලේ සේවකයෝ වැඩ වර්ජනය ........................................

i කළේ ය. ii කරයි. iii කළහ. iv කළා ය.

03. පහත වාක්‍ය ඇත්තේ අපිළිවෙළට ය. ඒවා නිවැරදිව පෙළ ගස්වා ලියන්න.

i) විකුණුවාය / විකුණති / මල් / අම්මා / කඩා

..........................................................................................

ii) පෙන්වහි / පෙන්වයි / නිවැරදි / වැඩිහිටියෝ / මඟ

..........................................................................................

iii) යවමි / යවමු / කාලයේ / කඩදාසි / අපි / ඔරු / නිවාඩු

..........................................................................................

---

පිළිතුරු 3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය

iv) සෙළවෙයි / සුළඟට / ගස් / සෙලවෙහි

..................................................................................................................

v) බුරයි / සොරුන්ට / බල්ලා / බුරති

..................................................................................................................

vi) පදවහි / රියදුරෝ / පදවතු / රථ / පදවති.

..................................................................................................................